සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

පෙබරවාරි 04 සතිය

විෂය - චිත්‍ර කලාව

ශ්‍රේණිය - 10 (I වාරය)

සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 7.1.2. ලංකාතිලක විහාරය**

1. ඉගෙනුම් අත්වැල

- ගම්පොළ යුගයේ ඉදිවූ ලංකාතිලක විහාරය පැන්හල්ගල නම් වූ ගල්තලාවක් මත ඉදිකර ඇත.
- හතර වන බුවනෙකබාහු රජ කාලයට (ක්‍රි.ව. 1341 - 1351) අයත් මෙම ගොඩනැගිල්ල සේනාධිලංකාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නිර්මාණය කරන ලද්දකි. මෙහි නිර්මාණ ශිල්පියා වන්නේ ඉන්දියාවේ ස්ථපතිරායර් නම් ශිල්පියා යි.
- මෙම ගෘහ නිර්මාණය සඳහා ගඩොල් සහ හුණු බදාම යොදාගෙන ඇති අතර අතීතයේ දී එය මහල් 4කින් යුක්ත විය. පිටත බිත්තියේ නිර්මාණය කරන ලද ඇත් රූප හා පැන්නුම් කුලුනු විහාරයට අලංකාරයක් ගෙන දෙන වාස්තු විද්‍යාත්මක අංග වේ. ප්‍රතිමා ගෘහයට සම්බන්ධ කර සතර දිසාවේ සමන්, විභීෂණ, උපුල්වන් කතරගම හා ගණදෙවියන් උදෙසා සාදන ලද දේවාල පහක් දක්නට ලැබේ.
  - ✓ **බුද්ධ ප්‍රතිමා** - ප්‍රතිමා ගෘහයේ ඇති හිඳි බුද්ධ ප්‍රතිමාවේ දෙනෙත් විවෘත ව මෙන් ම, චීවරයේ රැළි තරංගාකාරව යොදමින් බුදුන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණ සමුදායට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත. එසේ මවීරාසන ක්‍රමයට වැඩහිඳියි.
  - ✓ **සිතුවම්** - මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට නෑකම් කියන ලංකාතිලක විහාර සිතුවම් අතර සූවිසි විවරණය, සොළොස්මස්ථානය, සත් සතිය ආදී සිතුවම් වැදගත් ස්ථානයක් ගනියි. එසේ ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා සේනාධිලංකාර අමාත්‍ය රූ චිත්‍රණය කර තිබීම දැකිය හැකි ය.



ලංකාතිලක රජ මහා විහාරය

බුද්ධ ප්‍රතිමා

සූවිසි බුදුවරුන්ගේ නිර්මාණ අතර 'කෝණාගම බුද්ධ'

සිව් හංස පුට්ටුව

2. ඇගයීම

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ලංකාතිලක විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග, චිත්‍ර හා මූර්ති නම් කරන්න.

2) ලංකාතිලක විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.

- යුගය/ කාලය
- අනුග්‍රහය
- ශිල්පියා

3) වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.

- සම්ප්‍රදාය
- වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම

4) ලංකාතිලක විහාරයේ බුදු පිළිමය පිළිබඳ පහත කරුණු ඇසුරින් කලාත්මක ඇගයීමක් කරන්න.

- මුද්‍රා
- ආසන ක්‍රමය
- සිවුර
- මුහුණේ ප්‍රකාශනය

5) ලංකාතිලක විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කරන්න.

- ශෛලිය
- ශිල්ප ක්‍රමය
- වර්ණ භාවිතය
- රේඛාකරණය